2018 පෙබරවාරි 02

AGDSL

විගණකාධිපති
දෙපාර්තමේන්තුව

# ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණය



# ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණය

-------------------------------------------

**විධායක සාරාංශය**

**--------------------**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් සිදුකළ විගණනයේදී නිරීක්ෂණය වූ කරුණු අනුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණය පිළිබඳ විශේෂ වාර්තාවක් සකස් කිරීමේ අවශ්‍යතාවයක් පෙනී ගිය අතර, ඒ අනුව ඉහත මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව ඉදිරිපත් කරන ලද මාගේ වාර්තාවට අමතර වශයෙන් මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ. මෙම වාර්තාවේ අරමුණ 2005 ජනවාරි 01 සිට 2016 දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදයේ ශ්‍රී ලංකා ජනරජයේ ණය කළමනාකරණය පිළිබඳව විශ්ලේෂණාත්මක වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම වේ.

(i) උක්ත මූල්‍ය ප්‍රකාශන ජනරජයේ මූල්‍ය ප්‍රකාශන ලෙස නම්කර තිබුණද, ඒකාබද්ධ අරමුදලේ ගනුදෙනුවලට පමණක් මෙම මූල්‍ය ප්‍රකාශන සීමාවී තිබුණි. ඒ අනුව, පළාත් සභා, පළාත් පාලන ආයතන, රාජ්‍ය ව්‍යවසායන් සහ ජනරජයට අයත් හෝ රජයේ පාලනය යටතේ පවතින වෙනත් ආයතන වලට අයත් ගනුදෙනු හා සිද්ධීන් සහ වත්කම් හා වගකීම් මෙම මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර නොතිබුණි.

(ii) විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව, 2016 දෙසැම්බර් 31 දිනට රජය විසින් ගෙවීමට තිබූ මුළු දේශීය හා විදේශීය ණය ප්‍රමාණය ආසන්න වශයෙන් රු. ට්‍රිලියන 8.9 (රු. දශ ලක්ෂ 8,860,770) ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වලට අනුව ගිණුම්ගතකර තිබූ මුළු වත්කම්වල වටිනාකම ආසන්න වශයෙන් රු. ට්‍රිලියන 1.1 (රු. දශ ලක්ෂ 1,087,255) ක් පමණ විය. මුළු ශුද්ධ ණය ගැනීම් ප්‍රමාණවත් ලෙස හා ඇස්තමේන්තුගත පරිදි ආයෝජන කාර්යයන් සඳහා උපයෝජනය නොකිරීම හා ඉන් ජනිත වන වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම ආදිය මීට ආසන්න හේතුව වී තිබුණි.

(iii) රටේ ණය බර ඉතා සීඝ්‍රයෙන් ඉහළ යමින් තිබුණද, ඊට සාපේක්ෂව මූල්‍ය නොවන වත්කම් ඉහළ ගොස් නොතිබීම.

(iv) රජය විසින් ලබාගනු ලබන මුළු ශුද්ධ ණය වලින් සැළකිය යුතු ප්‍රමාණයක් දෛනික අවශ්‍යතා (පුනරාවර්තන ස්වරූපයේ වැය) සඳහා භාවිතා කර තිබීම.

(v) ඒකපුද්ගල ණය ප්‍රමාණය අඛණ්ඩව වර්ධනය වීම.

(vi) සංශෝධිත අයවැය ඇස්තමේන්තුවට සාපේක්ෂව සත්‍ය මූල්‍යකරණය (අයවැය හිඟය පියවීම) අඩු වීම හා ඊට අනුරූපීව 2016 වර්ෂයේ අපේක්ෂිත මුළු ණය ගැනීම් පහළ යාම.

(vii) මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොමැති ණය ශේෂ පැවතීම.

(viii) උපලබ්ධි වූ නමුත් ප්‍රතිපාදන නොමැතිවීම මත ගිණුම්ගත නොකළ විදේශ ණය පැවතීම.

ඉහත කරුණු හේතුවෙන් රාජ්‍ය ණය කළමනාකරණය ඉතාමත් දුර්වල තත්ත්වයක පවතින බව නිරීක්ෂණය වූ අතර, රාජ්‍ය ණය ශේෂය ඉහළ යාම පාලනය කර ගැනීම අත්‍යාවශ්‍ය කරුණක් ලෙස හඳුනාගත හැක. එසේම, ලබා ගනු ලබන රාජ්‍ය ණය කාර්යක්ෂමව, ආර්ථිකභාවයෙන් යුතුව හා ඵලදායී ලෙස භාවිතා කළ යුතු අතර, එසේ භාවිතා කරන බව සහතික කිරීම සඳහා සුදුසු අභ්‍යන්තර පාලන ක්‍රම සැළසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා යාවත්කාලීනව පවත්වාගෙන යාම කලමනාකරණයේ වගකීමක් වේ.

තවද, රටට ලැබෙන රාජ්‍ය හා රාජ්‍ය නොවන සියළුම ණය මධ්‍යගත ආයතනයක අනුමැතිය යටතේ සිදු කිරීම සහ ඕනෑම මොහොතක රාජ්‍ය ණය ශේෂය හඳුනාගත හැකි ක්‍රමවේදයක් හඳුන්වා දීම අත්‍යාවශ්‍ය කරුණකි.

**හැඳින්වීම**
**----------**

ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනය සඳහා රජය විසින් ලබා ගන්නා දේශීය හා විදේශීය ණය කළමණාකරණය පිලිබඳවද, එම ණය මුදල් මගින් කරනු ලබන රාජ්‍ය ආයෝජනවල ප්‍රතිඵලදායක බව සහ රටේ වත්කම්වල වටිනාකම ඉහළ නැංවීමට සුදුසුවන ආකාරයට එම අරමුදල් යොදාගෙන තිබේද යන්න පිළිබඳවද දිගින් දිගටම විවිධ පාර්ෂවවල කතාබහට ලක්වෙමින් පවතී. රජයේ ණය ගැනීම් සම්බන්ධයෙන් ප්‍රධාන වගකීම පැවරී ඇති මුදල් අමාත්‍යාංශයේ මහා භාණ්ඩාගාරය මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය ප්‍රකාශන (ඇමුණුම 1) හා අදාල වෙනත් වාර්තා තුළින් සමස්ථ රාජ්‍ය ණය වටිනාකම හා ඉන් ජනිත වන වත්කම් ප්‍රමාණවත් පරිදි හෙළදරව් වී නොමැති අතර, පසුගිය වසර වලට අදාල මාගේ වාර්තා පරීක්ෂා කිරීමේදීද මෙම තත්ත්තවය මනාව පැහැදිලි වේ. විශේෂයෙන්ම 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් සිදුකළ පරීක්ෂාවේදී මෙම අඩුපාඩු ඉතාමත්ම තීව්‍ර මට්ටමකට පැමිණ තිබූ බව නිරීක්ෂණය වූ අතර, විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට නොහැකි වීම හේතුකොට ගෙන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය ප්‍රකාශන සත්‍ය හා සාධාරණ ලෙස පිළියෙල කර තිබුණේද යන්න පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකි විය (ඇමුණම 2). මෙම මූල්‍ය ප්‍රකාශන සහ වාර්තාවලට අනුව, රටේ මුළු ණය ප්රමාණය ඉතා සීග්‍රයෙන් ඉහළ ගොස් ඇති අතර, එය නියෝජනය කිරීම සඳහා ඉදිරිපත් කර ඇති වත්කම් ප්‍රමාණාත්මක නොවීය. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශන සහ වාර්තාවල ප්‍රාග්ධන වියදම් යටතේ වත්කම් අත්පත් කර ගැනීම සඳහා දරන ලද වියදම මගින් ජනිත වන මූල්‍ය හා මූල්‍ය නොවන වත්කම් ජනරජ ගිණුම මගින් නිරූපණය කිරීම සඳහා එකී වියදමට සමාන නාමික ස්වරූපයේ ගිණුම් (ඇමුණුම 3) හඳුන්වාදී තිබුණි. (එම ගිණුම්, නාමික ගිණුම් බවට මුදල් අමාත්‍යාංශය ලිඛිතව පිළිගෙන ඇත.) 2016 දෙසැම්බර් 31 දින වන විට රජය විසින් ගෙවීමට තිබූ දේශීය හා විදේශීය මුළු ණය ප්‍රමාණය

ආසන්න වශයෙන් රු. ට්‍රිලියන 8.9 ක් වූ අතර (ඇමුණුම 4), එය නියෝජනය වන ලෙස ගිණුම් ගතකර තිබූ වත්කම්වල වටිනාකම ආසන්න වශයෙන් රු. ට්‍රිලියන 1.1 ක් වැනි සාපේක්ෂව අඩු අගයක් ගෙන තිබුණි. එසේම, මෙම ණය මුදල් ආපසු ගෙවීම සඳහා ඇති ක්‍රමවේදයන් සහ අදාල ආයෝජනයන්ගේ ඉපයීම් හැකියාව පිළිබඳව විධිමත් විමසීමක් හෝ සොයා බැලීමක් සිදු නොවන බැවින් මුළු ණය සහ පොලී ගෙවීම් මුළු රාජ්‍ය ආදායම ඉක්මවා යන තත්ත්වයට පත්වෙමින් පවතී.

විගණනයට ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂ 11 ක (ඇමුණුම 5) එම ප්‍රකාශන සමඟ පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය වූ ඇතැම් කරුණු පහත දැක්වේ.

## 1. මුළු රාජ්‍ය ණය හා මුළු වත්කම් වාර්තා කිරීම

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව ගිණුම්ගත කරන ලද රාජ්‍ය ණය ප්‍රමාණය 2005 වර්ෂය අවසානයට රු. බිලියන 2,142 ක් වූ අතර, එය 2016 වර්ෂය අවසාන වන විට රු. බිලියන 8,861 ක් දක්වා එනම් රු. බිලියන 6,719 කින් ඉහළ ගොස් තිබුණි. එසේම, 2005 වර්ෂය අවසානයේදී රු. බිලියන 293 ක්ව පැවති මුළු වත්කම් (මූල්‍ය වත්කම් පමණි) ප්‍රමාණය, 2016 වර්ෂය අවසාන වන විට වැඩිවී තිබුණේ රු. බිලියන 1,087 ක් දක්වා (මූල්‍ය නොවන වත්කම් රු. බිලියන 347 ක්ද ඇතුළුව) එනම් රු. බිලියන 794 කින් පමණි. මේ අනුව රටේ ණය බර ඉතා සීග්‍රයෙන් ඉහළ යමින් තිබුණද, එම ණය මුදල් උපයෝජනයෙන් ජනිත වූ වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබූ බව නිරීක්ෂණය කෙරේ. එය පහත වගුව මගින් ද පෙන්වා ඇත.

| විස්තරය | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන |
| මූල්‍ය ප්‍රකාශන අනුව දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ණය ශේෂය | 2,142 | 2,480 | 2,829 | 3,243 | 3,731 | 4,177 | 4,730 | 5,520 | 6,105 | 6,721 | 7,830 | 8,861 | 10,339* |
| මූල්‍ය ප්‍රකාශන අනුව මුළු වත්කම් | 293 | 304 | 362 | 399 | 433 | 434 | 462 | 537 | 620 | 644 | 725 | 1,087 | 1,559** |

** මහ බැංකු වාර්තා අනුව 2017 නොවැම්බර් 30 දිනට තාවකාලික ශේෂය (Provisional)*

*** මුදල් අමාත්‍යාංශයේ තොරතුරුවලට අනුව 2017 දෙසැම්බර් 31 දිනට තාවකාලික ශේෂය (Provisional)*




2016 දෙසැම්බර් 31 දිනට රු. බිලියන 8,861 ක් වූ මුළු රාජ්‍ය ණය ශේෂය (රජය විසින් කෙටිකාලීන ණය වශයෙන් මහ බැංකුවෙන් ලබා ගෙන ඇති අත්තිකාරම්ද ඇතුළුව), රු. බිලියන 11,839 ක් වූ එම වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 74.8 ක් පමණ විය.

තවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තාවලට අනුව 2016 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ණය ශේෂය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 79.3 ක් විය. විස්තර පහත ප්‍රස්ථාරයෙහි දැක්වේ.

රාජ්‍ය ණය ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස (1950 – 2016) - Public Debt-to-GDP Ratio 1950-2016




*මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2016*

## 2. මුළු ශුද්ධ රාජ්‍ය ණය හා රාජ්‍ය ආයෝජන (ප්‍රාග්ධන වැය)

| විස්තරය | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන |
| මූල්‍ය ප්‍රකාශන අනුව වර්ෂය තුළ ලබාගත් මුළු ශුද්ධ ණය (මුළු ණය ගැනීම් වලින් ණය වාරික ආපසු ගෙවීම් අඩුකළ පසු) | 148 | 199 | 262 | 277 | 494 | 449 | 440 | 489 | 570 | 752 | 896 | 874 |
| මූල්‍ය ප්‍රකාශන අනුව රාජ්‍ය ආයෝජන (මූලධන වැය) | 164 | 198 | 271 | 297 | 366 | 347 | 399 | 471 | 456 | 596 | 684 | 594 |




මුළු ශුද්ධ රාජ්‍ය ණය (මුළු ණය ගැනීම් වලින් ණය වාරික ආපසු ගෙවීම් අඩුකළ පසු) ප්‍රමාණයට සමාන හෝ ඊට වැඩි ප්‍රමාණයක රාජ්‍ය ආයෝජන පවතින්නේ නම් ණය මුදල් උපයෝජනය තුලින් රටේ සංවර්ධනයක් සිදුවී ඇති බව නිරූපණය වුවද, 2016 වර්ෂයේ හා පෙර වර්ෂවල රාජ්‍ය ආයෝජන ලෙස හදුනාගත් වටිනාකම අදාළ වර්ෂය තුළ ලබාගත් ශුද්ධ ණය ප්‍රමාණයට වඩා අඩුවී තිබූ බව නිරීක්ෂණය විය. එසේම, එම රාජ්‍ය ආයෝජන තුළ රාජ්‍ය ආයතනවලට ලබා දෙන ප්‍රදාන, සමාජ සුභසාධන ස්වරූපයේ සංවර්ධන සහාය කාර්යයන් සඳහා කරනු ලබන වැය කිරීම්, පලාත් සභාවලට ලබාදෙන දායකත්වය ආදී වියදම්ද ඇතුළත් වේ. ඒ අනුව, රජය විසින් ලබාගනු ලබන මුළු ශුද්ධ ණය වලින් සැළකිය යුතු ප්‍රමාණයක් පුනරාවර්ථන ස්වරූපයේ වැය සඳහා භාවිතා කර තිබූ බව නිරීක්ෂණය විය.

එසේම, දීර්ඝ කාලයක් තිස්සේ රජය විසින් ලබාගනු ලබන දේශීය හා විදේශීය ණය වලින් සැළකිය යුතු ප්‍රමාණයක් ණය වාරික හා පොළී ගෙවීම සඳහා යොදා ගැනීමට සිදුවී තිබීම නිසා රටේ අපේක්ෂිත සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමට අපොහොසත් වී තිබුණි. ඒ අනුව, ණය ගැනීම්වලට සාපේක්ෂව රාජ්‍ය ආයෝජන වර්ධනය නොවීම තුළ ප්‍රමාණවත් පරිදි නිෂ්පාදන කර්මාන්ත ඇති නොවීම හා පුනරාවර්තන වියදම් ක්‍රමිකව ඉහළ යාම හේතුවෙන් රාජ්‍ය ණය බර දීර්ඝ කාලයක් තිස්සේ අඛණ්ඩව වර්ධනය වී තිබුණි. එසේම, සංවර්ධන ව්‍යාපෘති අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක වී නොතිබීමද හේතුවෙන් රටේ මූල්‍ය ස්ථාවරත්වයට මෙන්ම ණය ආපසු ගෙවීමේ හැකියාවටද අහිතකර ලෙස බලපෑම් ඇතිවිය හැකි බව නිරීක්ෂණය විය.

## 3. ඒක පුද්ගල ණය ප්‍රමාණය

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 11 ක මධ්‍ය වාර්ෂික ජනගහනය හා ඒකපුද්ගල ණය ප්‍රමාණය පහත දැක්වේ.

| විස්තරය | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ණය ශේෂය (රු. බිලියන)* | 2,142 | 2,480 | 2,829 | 3,243 | 3,731 | 4,177 | 4,730 | 5,520 | 6,105 | 6,721 | 7,830 | 8,861 |
| මධ්‍ය වර්ෂික ජනගහනය (‘000) (මහ බැංකු වාර්තාවට අනුව) | 19,668 | 19,886 | 20,010 | 20,217 | 20,450 | 20,653 | 20,869 | 20,424 | 20,585 | 20,771 | 20,966 | 21,203 |
| ඒකපුද්ගල ණය ප්‍රමාණය (රුපියල්) | 108,908 | 124,711 | 141,379 | 160,410 | 182,445 | 202,247 | 226,652 | 270,270 | 296,575 | 323,576 | 373,462 | 417,913 |

* *රාජ්‍ය ණය ශේෂය තුළ මහ බැංකුවෙන් ලබාගත් තාවකාලික අත්තිකරම්ද ඇතුළත්වේ.*




ඉහත තොරතුරු අනුව මුළු රාජ්‍ය ණය, මධ්‍ය වාර්ෂික ජනගහනය සමඟ සැසඳීමේදී 2005 දෙසැම්බර් 31 දිනට රු.108,908 ක් වූ ඒකපුද්ගල ණය ප්‍රමාණය, 2016 දෙසැම්බර් 31 දිනට රු.417,913 ක් විය. එසේම, එය 2015 දෙසැම්බර් 31 දිනට රු.373,462 ක් වූ ඒකපුද්ගල ණය

ප්‍රමාණය සමඟ සැසඳීමේදී 2016 දෙසැම්බර් 31 දිනට රු.44,451 ක එනම් සියයට 12 ක පමණ වැඩි වීමක් නිරීක්ෂණය විය. තවද, මුළු රාජ්‍ය ණය තුළ විදේශ ණය සැළකිය යුතු ප්‍රමාණයක් (එනම් සියයට 40 ට අධික ප්‍රමාණයක්) ඇතුළත් වී තිබීම සහ එය අඛණ්ඩව වර්ධනය වීමත්, විවිධ හේතූන් නිසා විදේශ මුදල්වලට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීමේ බලපෑම මතද ඒකපුද්ගල ණය ප්‍රමාණයේ සත්‍ය වටිනාකම තවදුරටත් ඉහළ යාමේ ඉඩකඩක් පවතී. එසේම, ගිණුම්ගත නොවූ ණය (ප්‍රතිපාදන නොමැතිවීම මත ගිණුම්ගත නොකළ විදේශ ණය සහ භාණ්ඩාගාර බැඳුම්කරවල මුහුණත අගය අඩුවෙන් සටහන් කිරීම) සහ ශේෂ පත්‍රයෙන් පිටත ගිණුම් ගත කර ඇති විදේශ ණය ප්‍රමාණය (Off Balance Sheet Items) ඉහත ණය ශේෂයට ඇතුළත් නොවන අතර, එම ණය ශේෂයද ගැලපූ පසු ඒකපුද්ගල ණය ප්‍රමාණය තවදුරටත් ඉහළ යනු ඇත.

## 4. අයවැය හිඟය මූල්‍යනය කිරීම (අයවැය හිඟය පියවීම)

2016 මූල්‍ය ප්‍රකාශන අනුව, අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා ඇස්තමේන්තු කරන ලද මුළු මූල්‍යකරණයේ එකතුව රු. බිලියන 1,724 ක් වූ නමුදු සත්‍ය මූල්‍යකරණයේ එකතුව රු. බිලියන 666 ක් වූයෙන්, එය සංශෝධිත අයවැය ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 61.4 ක අඩු වීමකි. ඊට අනුරූපීව සංශෝධිත අයවැය ඇස්තමේන්තුවට අනුව, සමාලෝචිත වර්ෂයේ අපේක්ෂිත දේශීය හා විදේශ ණය ගැනීම්වල එකතුව රු. බිලියන 2,438 ක් වුවද, දේශීය හා විදේශ ණය ගැනීම්වල සත්‍ය වටිනාකම රු. බිලියන 1,616 ක් වූයෙන් එය සංශෝධිත අයවැය ඇස්තමේන්තුවට සාපේක්ෂව රු. බිලියන 822 ක එනම් සියයට 33.7 ක අඩු වීමකි. 2016 වර්ෂය තුළ රජය විසින් ලබාගෙන තිබූ මුළු සත්‍ය ණය ප්‍රමාණය සංශෝධිත අයවැය ඇස්තමේන්තුව සමඟ සසඳා පහත දැක්වේ.

| ණය වර්ගය | 2016 වර්ෂය තුළ ණය ගැනීම් | | | |
|---|---|---|---|---|
| | 2016 වර්ෂයේ සංශෝධිත අයවැය ඇස්තමේන්තුව අනුව වටිනාකම | සත්‍ය වටිනාකම | අයවැය ඇස්තමේන්තුවට සාපේක්ෂව සත්‍ය ණය ගැනීම්වල වැඩිවීම/(අඩුවීම) | |
| | | | වටිනාකම | ප්‍රතිශතය |
| | රු. බිලියන | රු. බිලියන | රු. බිලියන | |
| විදේශ ණය | 300 | 574 | 274 | 91.3 |
| දේශීය ණය* | 2,138 | 1,042 | (1,096) | (51.3) |
| එකතුව | 2,438 | 1,616 | (822) | (33.7) |

** දේශීය ණය තුළ භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම මඟින් ලබාගත් ශුද්ධ වටිනාකම ඇතුළත් වේ.*

(i) ඉහත වගුවේ සඳහන් පරිදි 2016 වර්ෂයේ සංශෝධිත අයවැය ඇස්තමේන්තුවට සාපේක්ෂව, මුළු සත්‍ය ණය ගැනීම් රු. බිලියන 822 කින් එනම් සියයට 33.7 කින් පහළ ගොස් තිබුණි.

(ii) එසේම, දේශීය ණය ගැනීම් ඇස්තමේන්තුගත ණය ගැනීම්වලට සාපේක්ෂව රු. බිලියන 1,096 කින් එනම් සියයට 51.3 කින් පහළ ගොස් තිබුණද, විදේශ ණය ගැනීම් ඇස්තමේන්තුගත ණය ගැනීම්වලට සාපේක්ෂව රු. බිලියන 274 කින් එනම් සියයට 91.3 කින් ඉහළ ගොස් තිබුණි. ඒ අනුව, දේශීය බැංකු හා මූල්‍යායතන සතුව තිබූ අතිරික්ත මුදල් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීමේ අවස්ථාව සීමා වූයේද යන්න ප්‍රශ්නගත වේ.

## 5. මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොමැති ණය ශේෂ

5.1 ශේෂ පත්‍රයෙන් පිටත ගිණුම්ගත කළ ණය (Off Balance Sheet Items) - විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනට රජය විසින් ගෙවිය යුතුව තිබුණු ණය ශේෂය රු. බිලියන 8,861 ක් වුවද පසුගිය වසර කිහිපයකදී ලබාගෙන තිබූ, තවදුරටත් ගෙවීමට ඉතිරිව ඇති පහත විස්තර සඳහන් රු. බිලියන 826 ක ණය ශේෂය මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර නොතිබූ බව නියැදි පරීක්ෂණවලදී අනාවරණය විය.

| විස්තරය | වටිනාකම | වටිනාකම |
|---|---|---|
| | රු. බිලියන | රු. බිලියන |
| කල්පිරී නොමැති භාණ්ඩාගාර බැඳුම්කර මුහුණත අගයට ගිණුම්ගත නොකිරීම (2016 වර්ෂයට පෙර නිකුත් කරන ලද බැඳුම්කර) | | 487 |
| රජය විසින් ගෙවිය යුතුව තිබුණු ඇතැම් ණය ශේෂ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබීම | | |
| - 2005045 - පුත්තලම ගල් අඟුරු බලාගාරය අධියර 1 | 31 | |
| - 2006045 - පුත්තලම ගල් අඟුරු බලාගාරය අධියර 1 | 19 | |
| - 2007044 - හම්බන්තොට වරාය අධියර 1 | 33 | |
| - 2009027 - පුත්තලම ගල් අඟුරු බලාගාරය අධියර 2 | 116 | |
| - 2010006 - මත්තල අන්තර්ජාතික ගුවන් තොටුපල ව්‍යාපෘතිය | 24 | |
| - 2012033 - හම්බන්තොට වරාය අධියර 2 | 90 | |
| - 2013014 - හම්බන්තොට වරාය අධියර 1 අතිරේක වැඩ | 19 | 332 |
| පුද්ගල අනන්‍යතා ලේකම් කාර්යාලය ඉදිකිරීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික බැංකු 04 කින් ලබාගෙන තිබූ ණය මුදල මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබීම | | 7 |
| **එකතුව** | | **826** |

5.2 උපලබ්ධි වී තිබූ නමුත් ගිණුම්ගත නොකළ ණය - ණය ගිවිසුම් 14 කට අදාලව 2016 වර්ෂයේදි ලැබී තිබුණු විදේශ ණය වලින් රු. බිලියන 5 ක් හා, ණය ගිවිසුම් 09 කට අදාලව 2015 වර්ෂයේදි ලැබී තිබුණු විදේශ ණය වලින් රු. බිලියනයක් වශයෙන් එකතුව රු. බිලියන 6 ක ණය උපලබ්ධි වි තිබුණද, එම ණය මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. (ඇමුණුම 6)

## 6. මූල්‍ය කාර්යසාධනය

2015 වර්ෂයේ රු. බිලියන 2,357 ක් වූ මුළු රාජ්‍ය වියදම 2016 වර්ෂයේදී රු. බිලියන 2,365 ක් දක්වා රු. බිලියන 8 කින් එනම් සියයට එකකට වඩා අඩු ප්‍රතිශතයකින් ඉහළ ගොස් තිබුණද, මුළු පුනරාවර්තන වියදම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු. බිලියන 98 කින් එනම් සියයට 5.9 කින් ඉහළ ගොස් තිබුණි. ඉකුත් වර්ෂයේදී මුළු පුනරාවර්තන වියදමෙන් සියයට 31.5 ක් වූ ණය සඳහා පොළී ගෙවීම්, සමාලෝචිත වර්ෂයේදී සියයට 34.5 ක් දක්වා ඉහළ ගොස් තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයේදී මුළු වියදමෙන් සියයට 29 ක් වූ රාජ්‍ය ආයෝජන වියදම් සමාලෝචිත වර්ෂයේදී මුළු වියදමෙන් සියයට 25 ක් දක්වා පහළ බැස තිබුණි.

## 7. විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 වර්ෂයේ දේශීය හා විදේශීය ණය ගැනීම්, ණය වාරික හා පොළී ගෙවීම් සහ රාජ්‍ය ආදායම ඉකුත් වසර 04 සමඟ සන්සන්දනාත්මකව පහත වගුවේ සහ ප්‍රස්තාර වලින් දැක්වේ. (විස්තර අමුණුම 7 හි දැක්වේ).

| විස්තරය | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන |
| වර්ෂය තුළ ලබාගත් මුළු දේශීය ණය* | 2,255 | 2,178 | 2,020 | 2,794 | 2,518 |
| වර්ෂය තුළ ලබාගත් විදේශ ණය | 366 | 183 | 423 | 556 | 574 |
| **දේශීය හා විදේශ ණය ගැනීම් එකතුව** | **2,621** | **2,361** | **2,443** | **3,350** | **3,092** |
| වර්ෂය තුළ දේශීය ණය වාරික ගෙවීම** | 1,980 | 1,696 | 1,584 | 2,265 | 2,073 |
| වර්ෂය තුළ විදේශීය ණය වාරික ගෙවීම | 153 | 95 | 107 | 187 | 145 |
| **දේශීය හා විදේශීය ණය වාරික ගෙවීම් එකතුව** | **2,133** | **1,791** | **1,691** | **2,452** | **2,218** |
| **මුළු ශුද්ධ ණය ගැනීම් එකතුව** | **488** | **570** | **752** | **898** | **874** |
| වර්ෂය තුළ දේශීය ණය සඳහා පොළී ගෙවීම් | 351 | 401 | 376 | 450 | 510 |
| වර්ෂය තුළ විදේශීය ණය සඳහා පොළී ගෙවීම් | 58 | 63 | 70 | 78 | 101 |
| **මුළු ණය සඳහා පොළී ගෙවීම් එකතුව** | **409** | **464** | **446** | **528** | **611** |
| **මුළු ණය වාරික හා පොළී ගෙවීම් එකතුව** | **2,542** | **2,255** | **2,137** | **2,980** | **2,829** |

| | | | | | |
|---|---|---|---|---|---|
| **වර්ෂය තුළ මුළු ණය ගැනීම්වලින් මුළු ණය වාරික හා පොළී ගෙවීම් අඩු කළ පසු ඉතිරිය** | **80** | **106** | **306** | **370** | **263** |
| **රාජ්‍ය ආදායම** | **997** | **1,066** | **1,128** | **1,394** | **1,699** |
| සමස්ථ රාජ්‍ය ආදායමෙන් වර්ෂය තුළ ගෙවිය යුතු මුළු ණය වාරික හා පොළීවල එකතුව අඩුකළ පසු ඉතිරිය/(ඌනතාවය) (මේ සඳහා වර්ෂය තුළ ලබාගත් **දේශීය හා විදේශීය ණය** යොදාගැනීම) | (1,545) | (1,189) | (1,009) | (1,586) | (1,130) |
| **මූල්‍ය වාර්තාවලට අනුව දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ණය ශේෂය** | **5,520** | **6,106** | **6,721** | **7,830** | **8,861** |

* *වර්ෂය තුළ ලබාගත් දේශීය ණය තුළ භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම මඟින් ලබාගත් මුදල්ද ඇතුළත් වේ. [රු. බිලියන 1,635 + (1,042 – 159) = රු. බිලියන 2,518]*

** *දේශීය ණය වාරික ගෙවීම් තුළ භාණ්ඩාගාර බිල්පත් සඳහා වර්ෂය තුළ කරන ලද ගෙවීම්ද ඇතුළත් වේ. (රු. බිලියන 597 + 1,476 = රු. බිලියන 2,073)*

*** *ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුව 2017 නොවැම්බර් 30 දිනට රාජ්‍ය ණය ශේෂය (තාවකාලික)* ***රු. බිලියන 10,339*** *කි.*

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දේශීය ණය ගැනීම් සියයට 9.9 කින් පහළ යාම හා විදේශ ණය ගැනීම් සියයට 3.2 කින් ඉහළ යාම හේතුවෙන් වර්ෂය තුළ ලබාගෙන තිබූ මුළු ණය ප්‍රමාණය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 7.7 කින් පහළ ගොස් තිබුණි. එසේම, සමාලෝචිත වර්ෂය තුළ දේශීය හා විදේශ ණය වාරික ගෙවීම් සියයට 9.5 කින් අඩුවී තිබුණද, ණය සඳහා පොළී ගෙවීම් සියයට 15.7 කින් ඉහළ ගොස් තිබුණි.

2016 වර්ෂය තුළ ණය වාරික හා පොළී ගෙවීම්, වර්ෂය තුළ ලබාගත් මුළු ණය වලින් සියයට 91.5 ක් විය. වර්ෂය තුළ ලබාගත් මුළු ණය, වර්ෂය තුළ ණය වාරික හා පොළී ගෙවීම් හා වර්ෂය අවසානයට වූ මුළු රාජ්‍ය ණය ශේෂය ඉකුත් වසර 4 සමඟ සසඳා පහත ප්‍රස්තාරයෙහි දැක්වේ.




ඉහත ප්‍රස්ථාරය අනුව ණය ගැනීම් හා ණය වාරික හා පොලී ගෙවීම් සමගාමීව අඩු වැඩි වෙමින් පැවති අතර, වර්ෂය අවසානයට වූ මුළු රාජ්‍ය ණය ශේෂය වසර ගණනාවක් තිස්සේ අඛණ්ඩව වර්ධනය වී තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) 2016 වර්ෂය තුළ දේශීය ණය ගැනීම්, දේශීය ණය වාරික ආපසු ගෙවීම් සහ ශුද්ධ දේශීය ණය ගැනීම් ඉකුත් වර්ෂ 9 සමඟ සසඳා පහත සඳහන් වගුවේ සහ ප්‍රස්ථාරයෙහි දැක්වේ.

| විස්තරය | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. බිලියන | රු. බිලියන | රු. බිලියන | රු. බිලියන | රු. බිලියන | රු. බිලියන | රු. බිලියන | රු. බිලියන | රු. බිලියන | රු. බිලියන |
| දේශීය ණය ගැනීම් | 1,123 | 1,161 | 1,453 | 1,483 | 1,719 | 2,256 | 2,178 | 2,020 | 2,793 | 2,518 |
| දේශීය ණය ආපසු ගෙවීම් | 967 | 910 | 1,054 | 1,227 | 1,494 | 1,980 | 1,696 | 1,584 | 2,265 | 2,073 |
| **ශුද්ධ දේශීය ණය ගැනීම්** | **156** | **251** | **399** | **256** | **225** | **276** | **482** | **436** | **528** | **445** |
| දේශීය ණය ආපසු ගෙවීම්, දේශීය ණය ගැනීම්වල ප්‍රතිශතයක් ලෙස | 86.1 | 78.4 | 72.5 | 82.7 | 86.9 | 87.8 | 77.9 | 78.4 | 81.1 | 82.3 |




ඉහත තොරතුරු අනුව 2016 වර්ෂයේ මුළු දේශීය ණය වාරික ආපසු ගෙවීම්, මුළු දේශීය ණය ගැනීම් වලින් සියයට 82.3 ක් පමණ වූ අතර, ඒ අනුව, ශුද්ධ දේශීය ණය ගැනීම්, මුළු දේශීය ණය ගැනීම් වලින් සියයට 17.7 ක් පමණක් විය. තවද, සමාලෝචිත වර්ෂයේ මුළු දේශීය ණය ගැනීම්, වර්ෂය තුළ සිදුකළ ණය පොළී ගෙවීම් සියයට 20.3 ක් වූයෙන් මුළු ණය ගැනීම්, ණය වාරික සහ පොලී ගෙවීමට ප්‍රමාණවත් වී නොතිබුණි. ඒ අනුව, දේශීය ණය ගැනීම් මත ආයෝජන හැකියාවක් නොතිබූ බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | රු. බිලියන | රු. බිලියන |
|---|---|---|
| වර්ෂය තුළ ලබාගත් මුළු දේශීය ණය | | 2,518 |
| වර්ෂය තුළ දේශීය ණය වාරික ගෙවීම | 2,073 | |
| වර්ෂය තුළ දේශීය ණය සඳහා පොළී ගෙවීම් | 510 | |
| ණය වාරික හා පොළී ගෙවීම් එකතුව | 2,583 | (2,583) |
| වර්ෂය තුළ ලබාගත් ණය වටිනාකම ඉක්මවා ගෙවූ ණය වාරික හා පොළී ප්‍රමාණය | | (65) |

(ඇ) 2016 වර්ෂය තුළ විදේශීය ණය ගැනීම්, විදේශීය ණය වාරික ආපසු ගෙවීම් සහ ශුද්ධ විදේශීය ණය ගැනීම් ඉකුත් වර්ෂ 9 සමඟ සසඳා පහත සඳහන් වගුවේ සහ ප්‍රස්ථාරයෙහි දැක්වේ.

| විස්තරය | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. බිලියන | රු. බිලියන | රු. බිලියන | රු. බිලියන | රු. බිලියන | රු. බිලියන | රු. බිලියන | රු. බිලියන | රු. බිලියන | රු. බිලියන |
| විදේශීය ණය ගැනීම් | 177 | 120 | 208 | 262 | 287 | 366 | 183 | 423 | 556 | 574 |
| විදේශීය ණය ආපසු ගෙවීම් | 71 | 94 | 113 | 69 | 72 | 153 | 95 | 107 | 187 | 145 |
| **ශුද්ධ විදේශීය ණය ගැනීම්** | **106** | **26** | **95** | **193** | **215** | **213** | **88** | **316** | **369** | **429** |




2016 වර්ෂය ඉකුත් වර්ෂ තුන සමඟ සැසඳීමේදී ශුද්ධ විදේශ ණය ගැනීම් අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ මුළු දේශීය හා විදේශීය ශුද්ධ ණය ගැනීම් වලින් රාජ්‍ය ආයෝජන සඳහා සහ පුනරාවර්තන වැය සඳහා දරන ලද සත්‍ය වියදම් පහත වගුවේ සහ ප්‍රස්ථාරයෙහි දැක්වේ.

| විස්තරය | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|
| | රු. බිලියන | රු. බිලියන | රු. බිලියන | රු. බිලියන | රු. බිලියන | රු. බිලියන |
| වර්ෂය තුළ ශුද්ධ දේශීය හා විදේශීය ණය ගැනීම් එකතුව | 440 | 489 | 570 | 752 | 897 | 874 |
| වර්ෂය තුළ රාජ්‍ය ආයෝජන | (399) | (471) | (455) | (596) | (684) | (594) |
| ශුද්ධ ණය ගැනීම්වලින් පුනරාවර්ථන වියදම් දැරීම | 41 | 18 | 115 | 156 | 213 | 280 |



## 8. නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

රාජ්‍ය ණය කළමනාකරණයට අදාල නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවූ අවස්ථා පහත පරිදි විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව ඇස්තමේන්තුගත අයවැය හිඟය රු. බිලියන 1,488 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ ඇස්තමේන්තුගත අයවැය හිඟයට වඩා රු. බිලියන 317 ක හෙවත් සියයට 27 ක වැඩිවීමකි. 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව තථ්‍ය අයවැය හිඟය රු. බිලියන 666 ක් වූ අතර, එය ඇස්තමේන්තුගත අයවැය හිඟයට වඩා රු. මිලියන 822 ක අඩුවීමකි. සමාලෝචිත වර්ෂයේ තථ්‍ය අයවැය හිඟය ඇස්තමේන්තුගත දළ දේශිය නිෂ්පාදිතය වූ රු. බිලියන 11,839 න් සියයට 5.63 ක් වන අතර, ඒ අනුව එය 2013 අංක 15 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධන) පනතින් සංශෝධිත 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 3(අ) වගන්තියේ දක්වා ඇති ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5 ක් වූ සීමාව ඉක්මවීමකි.

(ආ) 2013 අංක 15 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධන) පනතින් සංශෝධිත 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත ප්‍රකාරව රජයේ මුළු බැරකම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 80 ක ප්‍රමාණයක් නොඉක්මවිය යුතුවේ. 2016 මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනට මුළු බැරකම් වටිනාකම රු. බිලියන 9,865 ක් වූ අතර, එය 2016 වර්ෂයේ ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතය වූ රු. බිලියන 11,839 සමග සැසඳීමේදී සියයට 83.3 ක් වූ හෙයින්, එය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ සඳහන් උපරිම බැරකම් සීමාව ඉක්මවා යාමක් බව නිරීක්ෂණය විය. විස්තර පහත වගුවේ දැක්වේ.

| **බැරකම්** | **2016 දෙසැම්බර් 31 දිනට බැරකම් වටිනාකම**** |
|---|---|
| | රු. බිලියන |
| බැංකු අයිරාව | 168 |
| මහ බැංකු අත්තිකාරම් | 83 |
| රාජ්‍ය ණය* | 8,794 |
| මූල්‍ය ප්‍රකාශන තුල ගිණුම්ගත නොකළ බැරකම්: | |
| - ශේෂ පත්‍රයෙන් පිටත ගිණුම් තබන විදේශ ණය | 332 |
| - භාණ්ඩාගාර බැඳුම්කර ශේෂය අඩුවෙන් ගිණුම්ගත කිරීම | 487 |
| **මුළු බැරකම** | **9,864** |

| | |
|---|---|
| ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතය - 2016 | 11,839 |
| මුළු බැරකම ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස | 83.3 |

* රාජ්‍ය ණය තුළ රු. බිලියන 16 ක් වූ කල්බදු ණය හිමියෝ ඇතුළත් නොවේ.

**මහා භාණ්ඩාගාරයේ ඇපකර මත රාජ්‍ය ව්‍යාපාර විසින් ලබාගෙන ඇති ණය සඳහා බැංකු වෙත ලබාදී තිබූ රු. බිලියන 563 ක් වූ ඇපකර ඉහත බැරකම් තුළට ඇතුලත් කර නොමැත. විස්තර පහත පරිදි වේ.

| **විස්තර** | **වටිනාකම** |
|---|---|
| | රු. බිලියන |
| රාජ්‍ය ව්‍යාපාර විසින් ලබාගෙන ඇති ණය සඳහා වූ ඇපකර | 497 |
| ණයවර ලිපි මත නිකුත් කරන ලද ඇපකර | 66 |
| **එකතුව** | **563** |

## 9. නිරීක්ෂණ සම්පිණ්ඩනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය ණය ශේෂය පසුගිය දශකය තුළ අඛණ්ඩව වර්ධනය වී තිබීම හා පසුගිය පස් වසර තුළ එය තිව්‍ර ලෙස ඉහළ යාම සහ ලබා ගන්නා වූ ණය වලින් ප්‍රාග්ධන වැය සඳහා සිදුවන්නා වූ උපයෝජන ප්‍රතිශතය අඛණ්ඩව පහළ යාම පාලනය වී නොතිබීම හේතුවෙන් රාජ්‍ය ණය රටේ සංවර්ධනයට හිතකර ආකාරයෙන් කළමනාකරණය වී නොමැති තත්ත්වයක් පෙන්නුම් කෙරේ.

(ආ) ජනරජයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය ඇතුළු මූල්‍ය වාර්තාකරණයට අදාළ නීති, රීති, ප්‍රමිති හා පරිචයන්ට අනුකූලව සිදුවී නොමැති හෙයින්, නිවැරදි හා විශ්වාසනීය තොරතුරු වාර්තා කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීමේ දැඩි අවශ්‍යතාවයක් පවතින බව නිරීක්ෂණය විය.

(ඈ) රාජ්‍ය ආයෝජන වලින් ජනිත වන වත්කම් හඳුනා ගැනීම, ඒවායේ පැවැත්ම, ඇගයීම, සම්පූර්ණත්වය හා නිවැරදිතාවය තහවුරු වීම සඳහා සුදුසු ක්‍රමවේදයක් හඳුන්වා දී නොමැති හෙයින් විධිමත් ක්‍රමවේදයක් නොපමාව හඳුන්වා දී කඩිනමින් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවයක් පවතින බව නිරීක්ෂණය විය.

(ඉ) රජයේ හෝ රජය වෙනුවෙන් ඇතිකර ගනු ලබන සියළුම බැඳීම් හා බැරකම් හඳුනා ගැනීම, මැනීම, ගිණුම්ගත කිරීම හා වාර්තාකරනය සඳහා සුදුසු ක්‍රමවේ හඳුන්වා දී ක්‍රියාත්මක වී නොමැති හෙයින් එම තත්වය යථාවත් කිරීමේ අවශ්‍යතාවයක් පවතින බව නිරීක්ෂණය විය.

(උ) රාජ්‍ය ණය කළමනාකරණ ක්‍රියාවලියට අදාළ සියළු කාර්යයන්හි වගකීම නිශ්චිතව එකිනෙක නිලධාරීන්ට විධිමත් ලෙස පැවරීම හා අධීක්ෂණය සතුටුදායක මට්ටමක නොපවතින බව අනාවරණය වූයෙන් ඒ පිළිබඳව දැඩි අවධානයක් යොමු කළ යුතු බව නිරීක්ෂණය විය.

(ඌ) මහා භාණ්ඩාගාරය, මහ බැංකුව සහ ණය සපයන ආයතන අතර මනා සම්බන්ධීකරණයක් ඇති කිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රමවේදයක් හඳුන්වා දීම අත්‍යාවශ්‍ය බව නිරීක්ෂණය විය.

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

# මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

## 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| අයවැය ඇස්තමේන්තුව 2016 රු. | | සටහන | සත්‍ය 2016 රු. | සත්‍ය 2015 රු. |
|---|---|---|---|---|
| | ආදායම් | | | |
| 1,474,000,000,000 | බදු ආදායම් | | 1,463,688,860,659 | 1,282,120,577,706 |
| 261,300,000,000 | ආදායම් බදු | 1 | 258,856,786,003 | 262,583,388,229 |
| 846,200,000,000 | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | 840,563,919,917 | 736,108,962,960 |
| 366,500,000,000 | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | 364,268,154,738 | 263,428,226,517 |
| 193,700,000,000 | බදු නොවන ආදායම් සහ වෙනත් | 4 | 235,066,299,613 | 112,124,825,023 |
| 1,667,700,000,000 | **මුළු ආදායම (අ)** | | **1,698,755,160,272** | **1,394,245,402,730** |
| | අඩුකලා - වියදම් | | | |
| 462,326,738,130 | වැටුප්, වේතන සහ වෙනත් සේවා ප්‍රතිලාභ | 5 | 452,700,758,165 | 429,742,326,857 |
| 312,484,248,993 | වෙනත් භාණ්ඩ හා සේවා | 6 | 148,955,501,716 | 162,965,683,901 |
| 577,307,863,970 | සහනාධාර, ප්‍රදානයන් සහ මාරුකිරීම් | 7 | 557,162,914,046 | 552,848,681,528 |
| 617,253,159,859 | පොලී ගෙවීම් | 8 | 610,894,570,875 | 527,227,571,912 |
| 1,30[illegible]966,7[illegible] | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 1,[illegible]68,007,[illegible]55 | [illegible]37,187,[illegible]57 |
| 1,[illegible]70,67[illegible]977,69[illegible] | පුනරාවර්තන වියදම් එකතුව (ආ) | | 1,770,[illegible]81,752,[illegible]57 | 1,672,[illegible]21,451,455 |
| 302,979,977,696 | **ආදායම් හිඟය (අ) - (ආ)** | | **72,126,592,385** | **278,676,048,725** |
| 1,184,819,007,163 | රාජ්‍ය ආයෝජන | 10 | 594,012,706,930 | 683,963,424,066 |
| 1,487,798,984,859 | **අයවැය හිඟය** | | 666,139,299,315 | 962,639,472,791 |
| | **අයවැය හිඟය මූල්‍යකරණය** | | | |
| 299,946,087,900 | විදේශීය ණය ගැනීම් | 11 | 574,248,733,877 | 556,370,365,051 |
| (146,004,830,000) | විදේශීය ණය ආපසු ගෙවීම් | | (145,119,354,547) | (187,112,820,912) |
| **153,941,257,900** | **ශුද්ධ විදේශීය ණය ගැනීම්** | | **429,129,379,330** | **369,257,544,138** |
| 15,554,239,700 | විදේශීය ප්‍රදානයන් | 12 | 7,495,973,314 | 6,013,856,669 |
| **169,495,497,600** | **මුළු විදේශ මූල්‍යකරණය** | | **436,625,352,644** | **375,271,400,807** |
| 2,137,692,381,406 | දේශීය ණය ගැනීම් | 13 | 1,041,541,256,617 | 1,187,230,889,942 |
| (597,375,860,000) | දේශීය ණය ආපසු ගෙවීම් | 14 | (596,429,280,381) | (659,282,286,890) |
| **1,540,316,521,406** | **ශුද්ධ දේශීය ණය ගැනීම්** | | **445,111,976,236** | **527,948,603,052** |
| 14,000,000,000 | උපණිත අපකර ගැනීම් | 15 | 18,619,493,425 | 12,960,805,528 |
| 300,000,000 | ප්‍රාග්ධන වත්කම් විකිණීම් | | 407,249,378 | 97,929,768 |
| | තැන්පතු ගිණුම් හා වගකීම්වල ශුද්ධ වෙනස්වීම් | | (204,849,978,399) | 13,053,564,559 |
| | මුදල් සහ ආසන්න මුදල් (අඩුවීම්/ වැඩිවීම්) | | (29,774,793,969) | 33,307,169,077 |
| 1,724,112,019,006 | **මුළු මූල්‍යකරණයේ එකතුව** | | 666,139,299,315 | 962,639,472,791 |

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

## 2016 දෙසැම්බර් 31 දිනට

| | | තත්‍ය | |
|---|---|---|---|
| | සටහන් | 2016<br>රු. | 2015<br>රු. |
| **මූල්‍ය නොවන වත්කම්** | 16 | **346,654,695,824** | **21,287,299,721** |
| **මූල්‍ය වත්කම්** | | | |
| රාජ්‍ය නිලධාරීන්ට ණය | 17 | 23,032,301,539 | 22,326,681,273 |
| රජයේ දෙපාර්තමේන්තු සඳහා අත්තිකාරම් | 18 | 16,092,914,751 | 9,878,043,209 |
| සාමාජික ගාස්තු ගෙවීම් | 19 | 3,517,179,875 | 3,517,179,876 |
| ණයදීම් | 20 | 169,547,195,852 | 174,196,100,153 |
| රජය සතු ව්‍යාපාරවල ප්‍රාග්ධන දායකත්වය | 21 | 526,907,427,450 | 492,129,872,096 |
| ණයගැනීම් මත ආයෝජනය | 22 | 8,793,959,329,494 | 7,684,953,706,734 |
| මුද්දර තොග ගිණුම | | 1,274,815,192 | 1,315,218,449 |
| කුලී සහ වැඩ අත්තිකාරම් | | 228,769,715 | - |
| **මූල්‍යමය වත්කම්වල එකතුව** | | **9,534,559,933,869** | **8,388,316,801,790** |
| **මුළු වත්කම්** | | **9,881,214,629,693** | **8,409,604,101,511** |
| **ව්‍යවස්ථාපිත සහ වෙනත් අරමුදල්** | | | |
| ඒකාබද්ධ අරමුදල | 23 | (187,247,051,579) | (403,025,504,824) |
| අවිනිශ්චිත අවස්ථා අරමුදල | | 500,000,000 | 100,000,000 |
| විදේශ ණය භ්‍රමන අරමුදල් | 24 | 21,625,057,252 | 25,747,620,522 |
| ආයෝජන මත පදනම් වූ අරමුදල් - SOEs | 25 | 696,454,623,302 | 666,325,972,249 |
| විවිධ අරමුදල් | 26 | 1,525,387,106 | 1,397,008,734 |
| ජංගම නොවන වත්කම් සංචිත අරමුදල | 27 | 346,883,465,539 | 21,287,299,722 |
| **මුළු අරමුදල්** | | **879,741,481,620** | **311,832,396,403** |
| **වගකීම්** | | | |
| බැංකු අයිරාව | 28 | 167,880,236,656 | 197,655,030,624 |
| ශ්‍රී ලංකා මහ බැංකු අත්තිකාරම් | 29 | 83,306,771,400 | 151,131,671,400 |
| රාජ්‍ය ණය ගැනීම් | 30 | 8,793,959,329,494 | 7,684,953,706,734 |
| තැන්පතු සහ වෙනත් වගකීම් | 31 | 64,342,790,904 | 63,142,399,483 |
| රජයේ දෙපාර්තමේන්තු සඳහා වූ මෙහෙයුම් ගිණුම | 32 | (108,635,044,897) | 277,042,446 |
| විවිධ ගිණුම් | 33 | 619,064,516 | 611,854,421 |
| **මුළු වගකීම්** | | **9,001,473,148,073** | **8,097,771,705,108** |
| **මුළු අරමුදල් සහ වගකීම්** | | **9,881,214,629,693** | **8,409,604,101,511** |
| **අසම්භාව්‍යය බැරකම් සහ බැඳීම්** | 34 | 563,337,457,000 | 431,954,283,000 |

මෙම මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කරන 'ගිණුම්කරණ ප්‍රතිපත්ති' සහ 'මූල්‍ය ප්‍රකාශයන්ට සටහන්' මෙම මූල්‍ය ප්‍රකාශයන්හිම අන්තර්ගතයක් ලෙස සැලකේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සතුවේ.

එස්.පී. සේනාරත්න
අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

ආර්.එච්.එස්. සමරතුංග
මුදල් අමාත්‍යාංශයේ ලේකම්
සහ භාණ්ඩාගාර ලේකම්

මහ භාණ්ඩාගාරය
කොළඹ 01.
2017 මාර්තු මස 23 වැනි දින.

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
**கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்**
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } ටීආර්ඊ/ඒ/ඩීඑස්ඒ/2/16/අයිඒ/05    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2017 මැයි 31

ලේකම්

මුදල් අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34   +94-11-2887223   oaggov@sltnet.lk   www.auditorgeneral.gov.lk

### 1.4 මතය ව්‍යාවනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය ව්‍යාවනය

මෙම වාර්තාවේ 2.2.ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

වගකීම් (රාජ්‍ය ණය ගැනීම්) වෙනුවෙන් ණය ගැනීම් සඳහා නාමික ආයෝජන ගිණුම්ද, වත්කම් ගිණුම් (මූල්‍ය නොවන වත්කම්) වෙනුවෙන් නාමික ජංගම නොවන වත්කම් සංචිත අරමුදලක්ද නිර්මාණය කර අඛණ්ඩව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුලනය කර තිබුණි. ඒ අනුව, ප්‍රාග්ධන වියදම් යටතේ වත්කම් අත්පත් කර ගැනීම සඳහා දරන ලද වියදම මගින් ජනිත වන මූල්‍ය හා මූල්‍ය නොවන වත්කම් ජනරජ ගිණුම මගින් නිරූපණය කිරීම අරමුණු කරගෙන ඒ සඳහා එකී වියදමට සමාන වත්කම් හා වගකීම් ඇතුළත් නාමික ගිණුම් හඳුන්වාදී තිබුණි. එමෙන්ම, දේශීය හා විදේශීය ණය සම්බන්ධ ගනුදෙනු ඒකාබද්ධ අරමුදල මගින් කළ යුතු බැවින් වර්ෂ අවසානයට පැවති එම අගයන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමේදී එම වටිනාකමට සමාන නාමික ආයෝජන ගිණුම් වත්කම් යටතේ දක්වා තිබුණි. ඒ අනුව, රු. මිලියන 8,793,959 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ණය ගැනීම් වලින් ජනිත වන ආයෝජන හා වත්කම් නිශ්චිතව හඳුනා ගැනීම, සහ ඒවායේ නිවැරදිතාවය, පැවැත්ම හා සම්පූර්ණත්වය පිළිබඳව තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. එසේම, මෙම ආයෝජන හා වත්කම් වටිනාකම තුළ පුනරාවර්තන වැය ඇතුළත්ව නොමැති බවට තහවුරු නොවීය.

### 2.2.2 ජනරජයේ මූල්‍ය ප්‍රකාශන

උක්ත මූල්‍ය ප්‍රකාශන ජනරජයේ මූල්‍ය ප්‍රකාශන ලෙස නම්කර තිබුණද, ඒකාබද්ධ අරමුදලේ ගනුදෙනුවලට පමණක් මෙම මූල්‍ය ප්‍රකාශන සීමාවී තිබුණි. ඒ අනුව, පලාත් සභා, පලාත් පාලන ආයතන, රාජ්‍ය ව්‍යවසායන් සහ ජනරජයට අයත් හෝ රජයේ පාලනය යටතේ පවතින වෙනත් ආයතන වලට අයත් ගනුදෙනු සහ වත්කම් හා වගකීම් මෙම මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර නොතිබුණි. තවද, 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 15(1) වගන්තිය පරිදි මුදල් අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත්කළ යුත්තේ අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාවක් බවද නිරීක්ෂණය කරනු ලැබේ.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනට රජය විසින් ගෙවිය යුතුව තිබුණු ණය ශේෂය රු. මිලියන 8,793,959 ක් වුවද, නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ පහත සඳහන් කරුණු අනුව එම ණය ශේෂය රු. මිලියන 826,091 ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබූ බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(i) ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවල භාණ්ඩාගාර බැඳුම්කර වලට අදාල ගිණුම්කරණ ප්‍රතිපත්තිය සමාලෝචිත වර්ෂයේදී වෙනස්කර තිබූ අතර, ඒ අනුව 2016 වර්ෂය තුළ නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර පමණක් ඒවායේ මුහුණත අගයට ගිණුම් ගතකර තිබුණි. එසේ වුවද, 2016 වර්ෂයට පෙර නිකුත් කරන ලද, සමාලෝචිත වර්ෂය අවසාන දිනට කල්පිරී නොමැති භාණ්ඩාගාර බැඳුම්කර මුහුණත අගයට ගිණුම්ගත නොකිරීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර බැඳුම්කර ශේෂය රු. මිලියන 487,061 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ii) විදේශීය ණය දෙන ආයතන සමඟ රජය විසින් එළඹ තිබූ ණය ගිවිසුම් 7 කට අදාළව 2016 දෙසැම්බර් 31 දින වන විට රජය විසින් ගෙවිය යුතුව තිබුණු රු. මිලියන 332,305 ක ණය ශේෂ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

(iii) රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය විසින් පුද්ගල අනන්‍යතා මහ ලේකම් කාර්යාලය ඉදිකිරීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික බැංකු 04 කින් ලබාගෙන තිබූ රු. මිලියන 6,725 ණය මුදල මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි.

තවද, මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් විදේශ ණය අවසන් ශේෂය, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 854-1 වාර්තාව සමඟ සැසඳීමේදී, ණය ගිවිසුම් 08 කට අදාල ශේෂවල රු. මිලියන 1,505 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ විදේශ ණය ලැබීම් හා විදේශ ණය ගෙවීම් පිළිවෙලින් රු. මිලියන 574,249 ක් හා රු. මිලියන 145,119 ක් වූ නමුදු, ඒ සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරීක්ෂාවේදී, මූල්‍ය ප්‍රකාශනවල විදේශ ණය ලැබීම් හා ගෙවීම් පිලිවෙලින් රු. මිලියන 8,945 ක් හා රු. මිලියන 5,848 ක් අඩුවෙන් දක්වා තිබූ බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(i) විදේශීය ණය ගිවිසුම් 7 කට අදාලව 2016 වර්ෂයේදී ලැබී තිබුණු රු. මිලියන 3,039 ක විදේශ ණය ප්‍රමාණය හා 2016 වර්ෂයේදී ගෙවා තිබුණු රු. මිලියන 5,848 ක විදේශ ණය ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කර නොතිබුණි.

